සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

Learning Resource Center
R
De Mazenod College
Kandana

# පළමු වාර පරීක්ෂණය - 2025

# බුද්ධ ධර්මය

08 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ 9-05-2025

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. බුදුරජාණන් වහන්සේගෙන් පංචවරයක් ඉල්ලා සංඝභේදය සිදුකළේ,
    (1) ඡන්න හිමි (2) දේවදත්ත හිමි
    (3) කාළුදායී හිමි (4) නන්ද හිමි

02. පිරිනිවන් මංචකයේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණියේ,
    (1) සෝණදණ්ඩ බ්‍රාහ්මණයා (2) සංජය පිරිවැජියා
    (3) සුභද්‍ර භික්ෂුව (4) සොත්ථිය බමුණා

03. ධර්ම රත්නයේ ගුණ
    (1) හයකි. (2) හතකි.
    (3) දහයකි. (4) සතරකි.

04. ධර්මය මනාව පුරුදු කරන්නාට එම මොහොතේදී ම ප්‍රතිඵල ලැබෙන බැවින් ධර්මය
    (1) සන්දිට්ඨිකය (2) අකාලිකය
    (3) ස්වක්ඛාතය (4) ඕපනයිකය

05. කාන්තාවන්ට පැවිද්ද ලබාදෙන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් කිහිප විටක් ඉල්ලා සිටියේ,
    (1) කිසාගෝතමියයි. (2) යශෝදරාවයි.
    (3) මහා ප්‍රජාපතී ගෝතමියයි. (4) සුජාතාවයි.

06. සංඝයා වහන්සේලාට මතක වස්ත්‍රයක් පූජා කරනු ලබන්නේ,
    (1) මංගල උත්සවයකදී (2) අවමංගල උත්සවයකදී
    (3) දානමය කටයුත්තකදී (4) පිරිත් පිංකමකදී

07. විපත්ති පටිබාහාය - සබ්බ සම්පත්ති සිද්ධියා.... මෙම ගාථාව සජ්ජායනා කරනු ලබන්නේ,
    (1) පැන් වැඩීමක දී (2) දානමය පිංකමක දී
    (3) පිරිත් පිංකමක දී (4) මංගල උත්සවයක දී

08. නව අරහාදී බුදුගුණ සිහිකරමින් සිදුකරන භාවනාව වන්නේ,
    (1) මෛත්‍රී භාවනාව (2) බුදුගුණ භාවනාව
    (3) සමථ භාවනාව (4) විදර්ශනා භාවනා

09. බුදුරජාණන් වහන්සේ ධර්ම සේනාධිපති තනතුර ලබාදුන්නේ,
    (1) මුගලන් තෙරණුවන්ට (2) සැරියුත් තෙරණුවන්ට
    (3) නන්ද තෙරණුවන්ට (4) කාශ්‍යප තෙරණුවන්ට

10. භාග්ගව බමුණා සහ මන්තානි බැමිණියගේ පුතණුවන්,
(1) දේවදත්ත කුමරා (2) අහිංසක කුමරා
(3) සිදුහත් කුමරා (4) නන්ද කුමරා

11. පැරණි සිරිත් විරිත් අනුව ගණ දෙවියන්ට සහ සරස්වතී දේවියට පූජා වට්ටියක් තබ දේවාශීර්වාදය ලබා සිදුකරන උත්සවය වන්නේ,
(1) උපන්දින උත්සවයයි. (2) අත්පොත් තැබීමේ අවස්ථාව
(3) මංගල උත්සවයයි. (4) අවමංගල උත්සවයයි.

12. පිරිත් පිංකමක දී ප්‍රධාන පිරිත් හුය බැඳීමට සකසා ගන්නේ,
(1) රාජගහයි. (2) වලයමයි.
(3) පිරිත් ගෙයයි. (4) ආටානාටියයි.

13. සාමණේර හිමි නමක් විසින් සමාදන් වන ශීලය,
(1) අෂ්ටාංග ශීලයයි. (2) දස ශීලයයි.
(3) පංච ශීලයයි. (4) නිත්‍ය ශීලයයි.

14. සැරියුත් තෙරණුවන් රහත් ඵලයට පත්වූයේ,
(1) පරාභව සූත්‍රය ඇසීමෙනි. (2) ව්‍යග්ඝ පජ්ජ සූත්‍රය ඇසීමෙනි.
(3) වේදනා පරිග්ගහ සූත්‍රය ඇසීමෙනි. (4) රතන සූත්‍රය ඇසීමෙනි.

15. කාලසීලාවට වැඩමවා පිරිනිවන් පා වදාළේ,
(1) සැරියුත් රහතන් වහන්සේ (2) ආනන්ද හිමි
(3) මුගලන් මහ රහතන් වහන්සේ (4) කාශ්‍යප මහ රහතන් වහන්සේ

16. උපතිස්ස පිරිවැජියා ගාථා දෙපදයක් ඇසීමෙන් සෝවාන්ඵලයට පත්විය. එම ගාථාව වන්නේ,
(1) අක්කෝච්ඡි මං අවධිමං (2) යස්ස පාපං කතං කම්මං
(3) නත්ථි මේ සරණං අඤ්ඤං (4) යේ ධම්මා හේතුප්පබවා

17. ''ඇම පමණින් පැවසූ මුනි දැන නතු - මෙම හැම දෙන බලවයි දැක්විය යුතු''
ඉහත කවිය අඩංගු වන්නේ,
(1) කාව්‍යශේඛරය (2) ගුත්තිල කාව්‍ය
(3) ලෝවැඩ සඟරාව (4) සසදාවත

18. බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑම සිදුවූයේ වයස,
(1) අවුරුදු 70 දී (2) අවුරුදු 45 දී
(3) අවුරුදු 80 දී (4) අවුරුදු 35 දී

19. සිතින් සිදුවන අකුසල කර්මයකි,
(1) ඉවසීම (2) ව්‍යාපාදය
(3) අමෝහය (4) අද්වේෂය

20. දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරන ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
(1) යශෝදරා දේවියගේ ඉල්ලීමට ය. (2) ආනන්ද හිමියන්ගේ ඉල්ලීමට ය.
(3) ප්‍රජාපතී තෙරණියගේ ඉල්ලීමට ය. (4) සුදොවුන් රජුගේ ඉල්ලීමට ය.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

01. (1) වෑත්තෑවේ හිමි විසින් රචිත කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

(2) බිම්බිසාර රජතුමාගේ පුත්‍රයා කවුරුන් ද?

(3) බුද්ධ ශාසනයේ සිව්වනක් පිරිස නම් කරන්න.

(4) රෝහිණී නදියේ ජලය බෙදාගැනීම අරභයා සටන්වැදුණු පාර්ශව දෙක කවුරුන් ද?

(5) සුද්ධෝදන රජතුමා සහ මහා ප්‍රජාපතී දේවියගේ පුත් කුමරා කවුරුන් ද?

(6) "මහනෙල් සුවඳම ය, කුඩමසු පිළී ගඳමය" යන කවිය සම්පූර්ණ කරන්න.

(7) සංඝරත්නයේ ගුණ ගණන කීය ද?

(8) පිරිත් පිංකමක දී පිරිත් මණ්ඩපයේ උඩට වියන් බැඳ එල්ලනු ලබන අතු වර්ග මොනවා ද?

(9) භුක්තානුමෝදනාව සිදුකරනු ලබන්නේ කුමක් අරභයා ද?

(10) භාවනාවක දී ශිෂ්‍යයන් සහ ශිෂ්‍යාවන් වාඩිවිය යුත්තේ කෙසේ ද? (ල. $2 \times 10 = 20$)

02. (1) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹු වන ආචාරශීලී ගුණාංග තුනක් ලියන්න.

(2) එහි එක් ගුණාංගයක් වන "නිහතමානී බව" කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 10)

03. (1) ධර්මරත්නය වඳින ගාථාව ලියන්න.

(2) ඉන් ගුණ 2 ක් පිළිබඳ කෙටියෙන් පහදන්න. (ල. 10)

04. (1) උපන්දින උත්සවයක් ආගමානුකුල ව සිදුකරන අයුරු කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

(2) ගෘහ ප්‍රවේශ මංගල්‍යයකදී බෞද්ධයකු ලෙස ඔබ අනුගමනය කරන චාරිත්‍ර පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(3) මියගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීමේ දී ප්‍රකාශ කරන ගාථාව ලියන්න. (ල. 10)

05. (1) බුදුගුණ භාවනාවට සූදානම් වන දරුවන්ගේ පෙර සූදානම කෙටියෙන් පැහැ
කරන්න.

(2) බුදුගුණ භාවනාවේ ආනිශංස 4 ක් ලියන්න.

(3) බුදුරජාණන් වහන්සේගේ විජ්ජාචරණ සම්පන්න ගුණය හඳුන්වන්න. (ල. 1

06. (1) උපතිස්ස හා කොලිත පිරිවැජියාගේ ගිහිකල ආචාර්යවරයා කවුරුන් ද?

(2) අස්සජි තෙරණුවන් උපතිස්ස පිරිවැජියාට දේශනා කළ "යේ ධම්මා හේතුප්පභව
ගාථාව සම්පූර්ණ කරන්න.

(3) මුගලන් මහරහතන් වහන්සේ කළ ශාසනික සේවාවන් 3 ක් ලියන්න. (ල. 1

07. (1) "යෝච පුබ්බේ පමජ්ජිත්වා" ගාථාව සම්පූර්ණ කරන්න.

(2) එම ගාථාවේ අදහස ලියන්න.

(3) සම්මුඤ්ජනි තෙරණුවන්ට නිවන් අවබෝධ කර ගැනීමට උපකාර කළ රහත
වහන්සේ කවුද? (ල. 10